සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

10 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2018 | 21 S I

## සිංහල භාෂාව හා සාහිත්‍යය I

කාලය පැය එකයි.

උපදෙස් :
* සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

★ **පහත වාක්‍යවල ඉරි ඇඳි කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වරණය තෝරන්න.**

(01) ව්‍යාපාරික කටයුතු වඩාත් දියුණු කිරීමට තමා දැරූ සියලුම උත්සාහයන් වතුරේ ගිය බව සිතීම පවා ඔහුට මහත් වේදනාවක් විය.
1. වැස්සට හසු වූ බව. 2. දියෙහි ගිලී ගිය බව. 3. අපතේ ගිය බව. 4. නො පෙනී ගිය බව.

(02) කළමනාකරු ගත් හදිසි තීරණය ඇසූ සේවකයෝ අන්ද මන්දව බලා සිටියහ.
1. උමතුවෙන් මෙන්.
2. බයෙන් මෙන්.
3. අන්ධභාවයට පැමිණීමෙන්.
4. කිසිවක් කරකියා ගත නොහැකිව.

(03) හය හතර නොදන්නා මිනිසුන් මෙන් කටයුතු නො කරන ලෙස අධ්‍යක්ෂවරයා පාලක සභාවට දැනුම් දුන්නේ ය.
1. ගණන් කිරීමට නොදන්නා.
2. දැනුම් තේරුම් නැතිව.
3. සතර අපාය නොදන්නා.
4. ඉලක්කම් නොදන්නා.

★ **පහත දැක්වෙන ප්‍රකාශවල හිස්තැනට ගැළපෙන වඩාත් සුදුසු පදය තෝරන්න.**

(04) සියලු ජාතීන් අතර ____________ ඇති කිරීම තුළින් රට සංවර්ධනය කරා රැගෙන යා හැකි ය.
1. භේදභින්නතා. 2. ගැටුම්. 3. සංහිඳියාව. 4. ජාත්‍යාලය.

(05) ________________ යනුවෙන් හඳුන්වන්නේ නිර්මාණකරණයෙහි නිරන්තරයෙන් යෙදීමෙන් ලබා ගන්නා ප්‍රාගුණ්‍යයයි.
1. ප්‍රතිභාව 2. ව්‍යුත්පත්තිය 3. අනුකරණය 4. සාහිත්‍යාභ්‍යාසය

(06) වේදිකා නාට්‍ය නිර්මාණය කිරීම තනි පුද්ගලයකුගේ ________________ ප්‍රතිඵලයක් නොවේ.
1. පරිශ්‍රමයක 2. පරිකල්පනයක 3. පරිපූර්ණත්වයක 4. පරිශීලනයක

★ **පහත දැක්වෙන ප්‍රශ්නවල සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.**

(07) 1. මර්ධනය, ප්‍රතිඵලය, ලේඛණය.
2. සංදර්ශනය, පුස්තකාලය, ලේකම්
3. කාර්යාලය, පරිසණකය, වර්ධනය.
4. පරීක්‍ෂණය, ඓක්‍යය, දෙපාර්තුමේන්තුව.

(08) 1. කොට්ඨාසය, ආකර්ෂණය, ඖෂධ
2. පුරීක්‍ෂණ, විමර්ෂණය, ප්‍රකාශණය.
3. පර්යේශන, ශබ්ද කෝශය, සමීක්‍ෂණ.
4. ජ්‍යේෂ්ඨ, සම්ප්‍රධාය, නිර්මානය.

★ **පහත දැක්වෙන ප්‍රශ්නවල අකාරාදී පිළිවෙළට නම් යෙදී ඇති වරණය තෝරන්න.**

(09) 1. මහනුවර, අම්පාර, කළුතර, ගම්පහ
2. තුරඟ, ගජගා, හනුමා, සැවුලා
3. අමාවතුර, පූජාවලිය, බුත්සරණ, සැළලිහිණිය
4. සවින්ද්‍යා, කනිෂ්ක, සනුර, අනුත්තරා

(10) 1. මඟුල්කෑම, හීන් සැරය, හත්පණ, මඩෝල්දූව
2. උදයන්ති, කරුණාරත්න, චන්ද්‍රපාල, තනූජා
3. යාපනය, කල්මුණේ, වව්නියාව, මන්නාරම
4. චඳුරා, උකුස්සා, මයිනා, ගිරවා

(11) පහත දී ඇති පදවල **පළමු අක්ෂරයෙහි පිළිවෙලින් පාපිල්ල, ඇදපිල්ල, යංශය හා රකාරාංශය** යෙදී ඇති වරණය තෝරන්න.
1. කුමන, මැලය, ව්‍යවස්ථාව, ප්‍රවීණ
2. කැරකිල්ල, බුරුමය, අසාධ්‍ය, භ්‍රමණය
3. මඩුල්ල, රුවල, මාධ්‍යය, මංගයා
4. රැවුල, පැළය, වසන්ත, ග්‍රමය



EXAMRESULTS.LK

★ පහත දැක්වෙන වරණයෙහි **නිවැරදි ලෙස පද විසන්ධි කර ඇති** වරණය තෝරන්න.

(12) 1. ගෙත්තම් - ගෙත් + අම් 2. බුත්සරණ - බුත් + සරණ
3. දෙයාකාර - දෙ + ආකාර 4. මහින්දාගමනය - මහින්ද + ගමනය

★ පහත දැක්වෙන වරණයෙහි **නිවැරදි ලෙස සන්ධි කර ඇති** වරණය තෝරන්න.

(13) 1. සිහින් + ඉඟ - සිහින්ඉඟ 2. එකින් + එක - එකින්එක
3. ඔවුන් + ඔවුන් - ඔවුන්ඔවුන් 4. පින් + ඇති - පිනැති

★ අංක 14 සිට 16 තෙක් ප්‍රශ්නවල **තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදිව දැක්වෙන** වරණය තෝරන්න.

(14) කවියාගේ වාග් කෝෂය **භාවික ගුණයට** මුල් තැන දෙන අතර, විද්‍යා ලේඛකයාගේ වාග් කෝෂය භාව හීන ය.
1. හැඟීමට 2. භාවිතයට 3. විචාරයට 4. අතිශයෝක්තියට

(15) ගොවිතැන සමඟ අත්‍යන්තයෙන් බැඳුණු අනෙක් **මහාර්ඝ** නිර්මාණය වැව යි.
1. ඉතා ප්‍රබල. 2. අගය කළ හැකි. 3. ඉතා උසස්. 4. විස්මයට පත්.

(16) සෑම මනුෂ්‍යයෙකු තුළ ම ස්වකීය ජන්ම භූමිය පිළිබඳ ව ඇත්තේ **අභිමානයකි.**
1. උඩඟුකමකි. 2. හීනමානයකි. 3. පසුතැවිල්ලකි. 4. ආඩම්බරයකි.

(17) මුලින් දී ඇති වචන අතුරෙන් **අන්‍යෝන්‍ය වශයෙන් ලංවන කාර්යයන් සමඟ බැඳී නො පවත්නා** පද පේළිය වන්නේ,
1. සහෘදයා, රසිකයා, ශ්‍රාවකයා, නාවිකයා. 2. බක්කප්පච්චි, කුඩප්පච්චි, මහම්මා, කුඩම්මා.
3. කයිබන, වැදම, මුත්තෙට්ටුව, සකපෝරුව. 4. මුදුනා, තට්ටයා, මට්ටයා, කලාතයා.

(18) මුලින් දී ඇති **ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් නොවන පදයක් සහිත** පද පේළිය තෝරන්න.
1. නිපාත - අතර, කෙරෙහි, ලෙස, විරහිත
2. උපසර්ග - අබල, සුදන, පිරිපුන්, අපමණ
3. ප්‍රයෝජ්‍ය ක්‍රියා - කරවයි, දුවවයි, නටවයි, බලවයි
4. මිශ්‍ර ක්‍රියා - පනිමින්, බලබල, කරමින්, නටමින්

(19) එක් එක් පද පේළියේ **සමානාර්ථ යෙදුම් පමණක් ඇතුළත් පද** පේළිය තෝරන්න.
1. පරිශීලනය - ඇසුරුකිරීම, ප්‍රහර්ෂය - අධික සන්තෝෂය, අනූන - අඩුනැති, මී කල් - මිහිකත
2. ආකස්මිකව - හේතුවක් නැතිව, පරිපෝෂිත - මැනවින් පෝෂණය වූ, සබවස - සත්‍යවචන, යුගත් ගිනි - කල්පාන්ත ගින්න
3. පරිකල්පනය - අනුමාන සිතුවිල්ල, ගාම්භීරත්වය - ගැඹුරු බව, තෙදින් - තේජසින්, අධි වාසනා - ඉවසීමේ ගුණය
4. වාච්‍යාර්ථ - මතුපිට අර්ථය, උක්තීන් - කියමන්, උවම් - උපහාස, කළණ මිත් - කල්‍යාණ මිත්‍ර

(20) මුලින් දී ඇති පදයට **සමානාර්ථයක් නොදෙන පදය ඇතුළත්** වරණය තෝරන්න.
1. මිතුරා - සකි, සබඳ, යහළුවා, බාසුරු 2. සිංහයා - මිගිඳු, සිහ, කේශර, ඇත්රුපු
3. සූර්යයා - හිරු, දිනකර, දියනෙත, අඹර මිණි 4. මුහුද - සයුර, සාගර, රුවනාර, අර්ණව

(21) **විරුද්ධාර්ථවත් පද යුගලයක් ඇතුළත් නොවන** වරණය තෝරන්න.
1. සරල - සංකීර්ණ 2. බහුල - සුලභ 3. ආකාර - විකාර 4. විශේෂ - සාමාන්‍ය

(22) පහත දැක්වෙන **නාම පදවල ප්‍රකෘති ප්‍රත්‍ය නිවැරදි ව** දක්වා ඇති පද පේළිය වන්නේ,
**පහන, බල්ලා, තාප්පය, පැදුර**

1. පහන් + අ, බල් + ආ, තාප්ප + ය, පැදුරු + අ 2. පහ + න, බලු + ආ, තාප්ප + අ, පැදුරු + අ
3. පහන + අ, බල් + ලා, තාප් + ප, පැදු + ර 4. පහන් + අ, බලු + ආ, තාප්ප + අ, පැදුරු + අ

(23) **නිවැරදි අදහස රහිත** වරණය තෝරන්න.
1. කර්ම කාරක වාක්‍යයක උක්ත කර්මයට අනුව ආඛ්‍යාතය තැබිය යුතු ය.
2. කර්ම කාරක වාක්‍යයක ශුද්ධ කර්ම කාරක ආඛ්‍යාතය වෙනුවට ලබ ධාතුවෙන් සකස් කරගත් ආඛ්‍යාත රූප තැබිය හැකි ය.
3. අකර්මක වාක්‍ය කර්ම කාරකයට හැරවිය හැකි ය.
4. උක්ත කර්මයෙහි පුරුෂය හා වචනය අනුව ආඛ්‍යාතය ගැළපිය යුතු ය.

(24) **ඌෂ්මාක්ෂර හැඳින්වීම සඳහා යොදන නාමයක්** වන්නේ මින් කුමක් ද?
1. අන්තඃස්ථ 2. සඤ්ඤක 3. ඝර්ෂ 4. අර්ධ ස්වර

(25) **අක්ෂර මනාව ගැළපීමෙන් සූචනය වන ග්‍රන්ථ නාමයක්** කියවෙන වරණය තෝරන්න.
1. ර තු අ ව මා ර
2. ර ණ ස බු දු ත්
3. ය ම පූ ව ජා ලි
4. ස ධ ම ත් ව ය ලි නා ර ර් ද්

**★ 26, 27 යටතේ දී ඇත් ප්‍රස්තාව පිරුළුවලට වඩාත් ගැළපෙන අදහස සහිත වරණය තෝරන්න.**

(26) නිහඬව සිටි කෙනෙකුට කරදර කර තමත් ද කරදරයට පත්වීම.
1. ඉඟුරු දී මිරිස් ගත්තා වගේ
2. මිටි තැනින් වතුර බහිනවා වගේ
3. ගඟෙන් පොල් එන්නා වගේ
4. දෙබරයට ගල් ගැහුවා වගේ

(27) සියලු හොඳ දේ සුළු වරදක් නිසා විනාශ වී යාම.
1. නයාට ගහලා පොල්ල වරද්ද ගත්තා වගේ
2. රෑ වැටුණු වලේ දවල් වැටුණා වගේ
3. කිරි කළයට ගොම බිඳක් දැම්මා වගේ
4. කොටි වලිගය අල්ලා ගත්තා වගේ

(28) පහත **(අ)** කොටසේ දැක්වෙන අක්ෂරයක් සහිත **(ආ)** කොටසට අයත් වචන **අනුපිළිවෙලින් ගැළපෙන** වරණය වන්නේ,

| අ | ආ |
|---|---|
| A. මහප්‍රාණ | E. සඳපහන් රැය |
| B. නාසික්‍ය | F. ගෝලීය අර්බුදය |
| C. අල්පප්‍රාණ | G. ඵලදායීතාව |
| D. සඤ්ඤක | H බ්‍රහ්ම දණ්ඩනය |

1. E F H G
2. F E G H
3. G E F H
4. G H F E

**★ අංක 29 සිට 30 යටතේ දී ඇති ප්‍රශ්නවල <u>ව්‍යාකරණානුකූල ව නිවැරදි</u> වාක්‍ය තොරන්න.**

(29)
1. අපි සියල්ලන් ම කීකරු විනීත ශිෂ්‍යයෝ වෙමු.
2. රත්න ශ්‍රී විජේසිංහ විශිෂ්ට ගීත රචකයෙකු වෙයි.
3. දුටුගැමුණු රජතුමා ශ්‍රේෂ්ඨ පාලකයෙකු විය.
4. ඔවුහු ක්‍රීඩකයෝ වෙති.

(30)
1. රටට හිතැති මිනිසෙකු වන්නේ කෙසේ ද?
2. සියල්ලෝ ම පන්තියට පැමිණ ඇත.
3. ඔවුහු තරඟය දිනාවි.
4. අපි නිදුක් වෙම්වා

(31) හේනක් ගිනි ලැමෙන් පසුව ලැබෙන **පළමු වැස්ස** හඳුන්වන්නේ,
1. අක් වැස්ස නමිනි.
2. අසණි වැස්ස නමිනි.
3. නා කපන වැස්ස නමිනි.
4. සිරිපොද වැස්ස නමිනි.

(32) ලට්ට ලොට්ට යන යුගල පදය අයත් වන්නේ පහත දැක්වෙන කවර **යුගල පද වර්ගයට** ද?
1. පළමු පදයේ අර්ථයක් ඇති දෙවන පදයේ අර්ථයක් නැති
2. විරුද්ධාර්ථ යුගල පද
3. පද දෙකේ ම අර්ථයක් නැති
4. පද දෙකේ ම සමානාර්ථය ඇති

(33) දී ඇති වරණ අතුරෙන් පහත සඳහන් කවියේ **සිවුවන පදය** තෝරන්න.

පෙරකල් ජාතියේ පැතුවා වැන්නේ
පරමල් පිදුවා දෝ පල දුන්නේ
නරමුල් ඇඟ ඇට කිඹුලෙකු වැන්නේ
........................................................

1. ලීල් නැතුව නිසරුව තෙපලන්නේ
2. හැම කල් මළ දා දෝ සැප වන්නේ
3. වාල් තමාවත් ඇද්ද ඉතින්නේ
4. මහල්ල නුඹගේ හිමි ද අසන්නේ

(34) වැවකින් ගොවිතැන සඳහා **මුල් වරට ජලය නිකුත් කිරීම** හඳුන්වන්නේ,
1. වෑ දිය නිල්ල නමිනි.
2. නානුමුර මංගල්‍යය නමිනි.
3. දියවර මංගල්‍යය නමිනි.
4. අලුසල් මඟුල නමිනි.

(35) **විරාම ලකුණු හා පද බෙදීම අතින් වඩාත් නිවැරදි** වරණය වන්නේ මින් කුමක් ද?
1. " යාළුවා, මාත් තල්ලු කරන්න උදව් වෙන්න ද?"
2. " යාළුවා මාත් තල්ලු කරන්න උදව් වෙන්න ද"?
3. " යාළුවා මාත් තල්ලු කරන්න උදව් වෙන්න ද"
4. " යාළුවා මාත් තල්ලු කරන්න උදව් වෙන්න ද?

(36) **"අප්පා උඹේ හොර දෙටුවා**
**අම්ම හරිම කුනකටුවා"** යන දෙබස ඇතුලත් **වේදිකා නාට්‍ය** කුමක් ද?
1. හුණුවටයේ කථාව 2. සිංහබාහු 3. කුවේණි 4. තලමල පිපිලා

(37) මොනරාගල පළාතේ **ගස්ලබු** හැඳින්වෙන්නේ,
1. පුහුල් නමිනි. 2. වට්ටක්කා නමිනි. 3. පැපොල් නමිනි. 4. අඹ නමිනි.

(38) ගස වතු සුදූ
වී පිරිසිදූ
පොහොය නැතිදූ
සිල්ගත් බඳූ
**යන පද්‍යයේ රචකයා වන්නේ,**

1. ඩබ්.ඒ. අබේසිංහ ය. 2. ගුණදාස අමරසේකර ය.
3. එච්.එම්. කුඩලිගම ය. 4. කුමරතුංග මුනිදාස ය.

(39) උදුල සොම් කැලුම් සියුරු හිමි පුවළ
පහළ වන බැවින් නම් වෙත නිසඹු දොළ
ලකල ගුවන් තළ සිරි යහන නිකසල
අතුල කුසුම් විලසින් සැදෙන කුරුවැල

ඉහත කවියේ සඳහන් පරිදි **"සඳ"**
1. බබළන, සෞම්‍ය කාන්තියෙන් යුතු උත්තම ස්වාමියෙකි.
2. අතුරන ලද මල් මෙන් වූ තාරකා පන්තියට නායකයෙකි.
3. අහස් තලය නැමැති ශ්‍රී යහනට කැලුම් විහිදුවන්නකි.
4. අධික ආශා ඇති රාත්‍රිය නැමැති කාන්තාවට දොළ පහරක් වැනි වූවකි.

★ **දී ඇති පාඨයේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වරණය තෝරන්න.**

(40) සාහිත්‍යකාරයන් ජීවිතය විවරණය කිරීමට යෙදූ ප්‍රතිභාවෙහි තියුණු බව මෙන් ම විවරණයට භාජනය වූ ජීවිත ප්‍රදේශයේ විශාලත්වය ද සාහිත්‍යක ශ්‍රේෂ්ඨත්වය මැනීමේ දී එක ලෙස වැදගත් කොට සැලකිය යුතු ය.

1. සාහිත්‍යයක විශිෂ්ටත්වය තීරණය කිරීමේ දී එම සාහිත්‍යකරුවන් ජීවිතය විවරණය කිරීමට දැක් වූ අපූර්ව වූ හැකියාව හා ඊට බඳුන් වූ ජීවිත පරාසයේ විශාලත්වය ද එක සේ වැදගත් වේ.
2. සාහිත්‍යකරුවන් ජීවිතය විවරණය කිරීමට දැක්වූ හැකියාව හා ඊට බඳුන් වූ ජීවිත ස්වභාවයෙහි විශාලත්වය සාහිත්‍යක විශිෂ්ටත්වය තීරණය කිරීමේ දී ඉතා වැදගත් වේ.
3. සාහිත්‍ය නිර්මාණයක විශිෂ්ටත්වය තීරණය වන්නේ සාහිත්‍යකරුවන් ජීවිතය විවරණය කිරීමේ දී දක්වන විශේෂ හැකියාව හා ඊට මුල් වූ ජීවිත ප්‍රදේශයේ විශාලත්වය යන දෙකරුණු ය.
4. සාහිත්‍යයක විශිෂ්ටත්වය තීරණය කිරීමේ දී එක සේ වැදගත් වන කරුණු අතර, සාහිත්‍යකරුවන් ජීවිතය විස්තර කිරීමේ දී දක්වන සුවිශේෂ හැකියාව හා ඊට පාදක වූ ජීවිත ස්වභාවය ඉතා වැදගත් වේ.

(ලකුණු 1 x 40 = 40)

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

**10 ශ්‍රේණිය** | වර්ෂ අවසාන පරීක්ෂණය - 2018 | **21 S II**

**සිංහල භාෂාව හා සාහිත්‍යය II** | කාලය පැය දෙකයි

**උපදෙස් :**
**සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

01. i සිට x තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. **කිසියම් අනුකොටසකට උත්තර නො ලියන්නේ නම්** එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

i. පහත සඳහන් අක්ෂර **කවර වර්ගයකට** අයත් දැයි නම් කරන්න.
(අ) ග, ජ, ඩ, ද, බ (ආ) ය, ර, ල, ව

ii. පහත සඳහන් පදවල අරුත් පැහැදිලි වන සේ **ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍ය දෙකක්** ලියා දක්වන්න.
(අ) සුලු (ආ) සුළු

iii. පහත සඳහන් වාක්‍යයෙහි ඇතුළත් **උපසර්ග පදයක් හා නිපාත පදයක්** උපුටා දක්වන්න.
ලෝකයේ ඕනෑම රටක ජනශ්‍රැතීන් අතර ජනකතාවට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි.

iv. පහත සඳහන් (අ) සහ (ආ) යටතේ දැක්වෙන අදහස්වලට ගැළපෙන **තනි පදය** බැගින් ලියා දක්වන්න.
(අ) අලුතින් ම නිර්මාණය කරන ලද කතාව
(ආ) නිරන්තරයෙන් ම අභ්‍යාසයේ නිරත වීම

v. පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. **එම වචන දෙක පමණක් නිදොස් කර** ලියන්න.
"සිංහලයන්ගේ භාෂාව වූ කලී වාග් ශක්තියෙන් අනූණ, එය කතා කරන ජනතාව මෙන් ම ශ්‍රේෂ්ඨ වූ, සුලලිත. සුබනම්‍ය, සුමදුර භාෂාවකි."

vi. පහත සඳහන් **වාක්‍ය සදොස් නම් පමණක් නිදොස්** කොට ලියන්න.
(අ) පන්තියේ ළමයින් සියල්ලෝ ම එකාවන්ව වැඩ කළහ.
(ආ) සභාවෝ තුමූ සතුටු සිතින් විසිර ගියහ.

vii. පහත සඳහන් පද නිවැරදි ව **විසන්ධි** කරන්න.
(අ) පන්සාලිස් (ආ) නොයෙක්

vii. පහත සඳහන් වාක්‍ය **කර්මකාරකයට** හරවන්න.
(අ) ගුරුවරු සිසුන්ට උපදෙස් දෙති. (ආ) සත්ත්වවේදියෙක් අසරණ සතෙකු රැක බලා ගනී.

ix. පහත සඳහන් ප්‍රාදේශික ව්‍යවහාර සඳහා යෙදෙන **පොදු ව්‍යවහාරය** ලියා දක්වන්න.
(අ) දැවා (ආ) මොනා

x. පහත සඳහන් පාඨයේ තද කළු අකුරින් මුද්‍රිත වචනවල **සරල අරුත්** දක්වන්න.
(අ) බසේ කිලිටිකම නැණ <u>සිලිලෙන්</u> දොවනා (ආ) <u>රුසේ</u> සියල්ලන් හට නව පණ පොවනා

(ලකුණු 2 x 10 = 20 යි)

02. පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරා ගෙන වචන 250 කට නො අඩු වන සේ රචනයක් ලියන්න.වරහන් තුළ දී ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා **<u>යෝග්‍ය මාතෘකාවක් ද</u>** යොදන්න.

(අ) නාගරික ප්‍රදේශවල අනවසර ඉදි කිරීම්, පහත් බිම් ගොඩ කිරීම්, කුඹුරු ඉඩම් වෙනත් ආර්ථික කටයුතුවලට යොදා ගැනීම් වැනි කටයුතු නිසා පාරිසරික ගැටලු ගණනාවක් පැන නැගී ඇත. අධික වැසි සහිත කාලවල මේ ගැටලු වඩාත් උග්‍ර වී ඇත. ඒ නිසා රාජ්‍ය හෝ පුද්ගලික සංවර්ධන කටයුතු ක්‍රමානුකූල පරිසර හිතකාමී සැලැස්මකට අනුව ක්‍රියාත්මක කළ යුතු ය.

(ආ) සාහිත්‍යය හා කලාව මිනිස් දිවිය යහපත් අයුරින් සකස් කොට නිරෝගී සමාජයක් ගොඩනැගීම සඳහා දායක කොට ගත හැකි ප්‍රබල මාධ්‍යයකි. වඩාත් සුබවාදී මානව දයාවෙන් පිරිපුන් ගුණධර්මවලින් හෙබි සමාජයක් බිහි කිරීම සඳහා උසස් ගණයේ සාහිත්‍ය නිර්මාණ හා කලාවන් අපේ සමාජයට පිදිය යුතු කාලය එළැඹ ඇත.

(ඉ) අපේ රටේ ජාතික වීරවරයන් ගැන කරුණු හැදෑරීම සඳහා වීර චරිතාපදාන අවශ්‍ය තරම් ඇත. එහෙත් ඒවා පරිශීලනය කිරීම සඳහා එතරම් උනන්දුවක් ඇති බව නො පෙනේ. මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය ද ඒ පිළිබඳ එතරම් උනන්දුවක් දක්වන බවක් නො පෙනේ. අපේ ජාතික වීරයන්ගේ චරිතාපදාන තුළින් උකහා ගත හැකි වටිනාකම් සියලු දෙනා තුළ පෝෂණය කළහොත් ශ්‍රී ලංකාව සෑම අතින්ම මීට වඩා යහපත් රටක් කළ හැකි ය.

(ඊ) ඔබ විනෝද චාරිකාවක  යෙදුණ අතරතුර මුහුදේ කලපු තීරයක බෝට්ටු සවාරියක් යාමට ද අවස්ථාව උදා විය. නොසිතූ පරිදි ඒ පිරිස අතර සිටි කුඩා ළමයකු විසි වී මුහුදට වැටුණි. ක්ෂණයකින් ක්‍රියාත්මක වූ ඔබ මුහුදට පැන පීනා ගොස් ළමයා බේරා ගෙන බෝට්ටුව වෙතට ගොඩ වුණි. ඔබ වෙවුලා ගැහෙන්නට වූයේ ඉන් පසුව ය. ඒ ඔබ මීට පෙර කිසිදාක වතුරට පැන  පීනා පළපුරුද්දක් නොතිබූ බැවිනි.

(ලකුණු 25 කි)

03. පහත දැක්වෙන පාඨය **<u>වචන 50-60 අතර වන සේ සාරාංශ කොට ලියන්න.</u>** ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග **<u>වරහනක් තුළ</u>** දක්වන්න.

අතීත සමාජයේ මිනිසා අතර සබඳතා වර්ධනයට ගොවිතැනේ දී වූ පිටිවහල ඉමහත් ය. පැළ සිටුවීම, වල් නෙලීම, අස්වනු රැස් කිරීම ආදී අවස්ථාවල දී සාමූහික ක්‍රියාකාරකම් ඉස්මතු විය. මෙවැන් අවස්ථාවල දී තම තමන්ගේ පටු මත භේද අමනාපකම් අමතක කළ ජනතාව එකමුතුව කටයුතු කළහ. මේ පසුබිම සමාජයේ පැවැත්මට මෙන් ම දියුණුවට ද වැදගත් විය. මේ අනුව මෙම සෑම කටයුත්තක ම සදාචාරාත්මක බව හා සාමූහික විඥානය ඉස්මතු විය. මෙබඳු සාරධර්ම නූතන සමාජය තුළ ආරක්ෂා වී ඇති දැයි සලකා බැලිය යුතු ය.

නවීකරණය මඟින් ජනිත  කරන ලද ප්‍රතිඵල හමුවේ පැරණි සමාජයේ අත්තම් ක්‍රමය අනුව සාමූහිකව කරන ලද කටයුතු යන්ත්‍රවලට  කරන්නට ඉඩ දීම නිසා  සමාජයේ ඒකාබද්ධතාව බිඳී ගොස් මිනිසා යන්ත්‍ර සමඟ හුදකලා වී ඇති බව පෙනේ.

නූතන සමාජය තුළ වේගවත් ක්‍රියාකාරිත්වයක් දැකිය හැකි ය. එය එක් අතකින් මිනිසා මානසික අවුලකට පත් කිරීමට ද හේතු වී ඇතැයි කිව හැකි ය. අජීවී යන්ත්‍ර හා ගත කරන මිනිසා තුළ සජීවී සත්ත්වයා කෙරෙහි තිබූ ලැදියාව අඩු වී ඇති බව පෙනේ. (ලකුණු 10 කි)

04. පහත දී ඇති ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් සාර්ථක කර ගැනීම සඳහා සෑම මිනිසකුට ම නිදහස හා සමානාත්මතාව උරුම කර දිය යුතු ය. මෙම නිදහස හා සමානාත්මතාව ප්‍රජාවගේ පැවැත්මට අතිශයින් ම වැදගත් ය. එය තහවුරු වන්නේ මූලික මිනිස් අයිතිවාසිකම් තුළිනි. මේ අනුව සමස්ත ප්‍රජාතන්ත්‍රවාදයේ ම පැවැත්ම තීරණය වන ප්‍රධානතම සාධකය වන්නේ මූලික මිනිස් අයිතිවාසිකම් ය. මූලික මිනිස් අයිතිවාසිකම් වන සිවිල් හා දේශපාලන අයිතිවාසිකම්, ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් සුරැකුණු විට සමඟිය සමානාත්මතාව හා දේශපාලන ස්ථාවරත්වය ගොඩ නැගේ. මේ සාධක මානව අයිතිවාසිකම් තුළින් තහවුරු වේ නම් ප්‍රජාතන්ත්‍රවාදයත් , මානව අයිතිවාසිකම් අතරත් ඇත්තේ එකිනෙක බැඳුණු සබඳතාවකි. 1948 එක්සත් ජාතීන්ගේ සංවිධානය ප්‍රකාශයට පත් කළ මානව අයිතිවාසිකම පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ මුල් වගන්ති තුන මඟින් මූලික මිනිස් අයිතිවාසිකම් පිළිබඳ ප්‍රබල විග්‍රහයක් කර ඇත.ඉන් ප්‍රථම වගන්තියෙන් කියවෙන්නේ සියලු මනුෂ්‍යයන් අභිමානය හා අයිතිවාසිකම් අතින් සමානව උපත ලබා ඇති බවත් සියලු දෙනා සහෝදරත්වයෙන් ක්‍රියා කළ යුතු බවත් ය. මෙවැනි  අයිතිවාසිකම්වල පැවැත්ම උදෙසා තිබිය යුතු සාධක ප්‍රජාතන්ත්‍රවාදී සංකල්පය තුළ ගැබ්ව ඇති හෙයින්  අයිතිවාසිකම් සාධාරණව හිමි වන්නේ සැබෑ ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් තුළ ය.

i. රටක ප්‍රජාවගේ පැවැත්ම සඳහා ඉතාම වැදගත් යැයි ලේඛකයා පවසන්නේ කුමන කරුණු ද?
ii. මූලික මිනිස් අයිතිවාසිකම් වඩාත් වැදගත් වන්නේ ඇයි?
iii. මූලික මිනිස් අයිතිවාසිකම් මනාව ආරක්ෂා වූ විට ඉන් ලැබෙන ප්‍රයෝජනය කුමක් ද?
iv. මානව අයිතිවාසිකම පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ පළමු වගන්තියේ සඳහන් වැදගත් කරුණු කුමක් ද?
v. මිනිස් අයිතිවාසිකම් සාධාරණව ඉටුවීමට සමාජයක වඩාත් සාර්ථකව ක්‍රියාත්මක විය යුත්තේ කුමක් ද?

(ලකුණු 10 යි)

05. පහත දැක්වෙන විස්තරය පදනම් කර ගෙන අත් පත්‍රිකාවක් නිර්මාණය කරන්න. මේ සඳහා **වචන 100 ක් පමණ** යොදා ගැනීම ප්‍රමාණවත් ය.

වර්තමානයේ වෙළඳ පලෙහි අලෙවි වන කෘත්‍රිම රසකාරක හා වර්ණ ගැන්වූ ආහාර පරිභෝජනය නිසා මිනිසුන් රෝගී වී ඇත. මේ ගැටලුවට පිළියමක් වශයෙන් 'චිරංජීව' සංවිධානය වස විෂෙන් තොර නිවසේ පිසිනු ලබන ආහාර හා සමානව ම පිසිනු ලබන ආහාර වර්ග අලෙවි කරන ව්‍යවසායකයන් පුහුණු කිරීම, ඒ සඳහා සහන ණය ආධාර ප්‍රදානය කිරීම හා වෙළඳ පළ අවස්ථා හඳුන්වා දීමේ පුහුණු වැඩසටහනක් ආරම්භ කර ඇත.  ඔබ එම සංවිධානයේ ප්‍රචාරක ලේකම් සුසිල් මානවබන්දු යැයි සිතා 2018.12.25 වන දින පැවැත්වෙන පුහුණු වැඩමුළුවට සහභාගී වන ලෙස දන්වා ප්‍රදේශවාසීන් අතර බෙදා හැරෙන අත් පත්‍රිකාවක් සකස් කරන්න.

**නැතහොත්**

වන සතුන්ගේ ගහණය ඉතා ශීඝ්‍රයෙන් වැඩි වීම නිසා මෑතක සිට ඔබේ ප්‍රදේශයේ ජනතාවට විවිධ දුෂ්කරතාවලට මුහුණ පෑමට සිදු වී ඇත. වල් ඌරන්, රිලවුන්, මොනරුන් වැනි සතුන් ද අලි, ඇතුන් ද කොටියන්, දිවියන් වැනි සතුන් ද මේ අතර ප්‍රධාන වේ. මේ නිසා ගොවීන්ට තම වගා කටයුතු කර ගැනීමට නොහැකි වීම නිසා විශාල බිම් ප්‍රමාණයක් වගා කටයුතුවලින් ඉවත් වී යමින් පවතින අතර එදිනෙදා කටයුතුවලට ද බාධා පැමිණ ඇත. මේ තත්වය මඟහරවා සත්ත්වාරක්ෂාව ද තහවුරු කොට ආර්ථික හා දෛනික කටයුතු පවත්වා ගෙන යාම සඳහා වනජීවී නිලධාරීන්ගේ ද සහය ලබාගෙන අවශ්‍ය කටයුතු යොදන ලෙස ප්‍රාදේශීය ලේකම් වෙත යැවෙන ලිපිය පිළියෙල කරන්න.ඔබ පොතානේගම, කහටගස්ලියද්ද ගම්මානයේ ජීවත් වන සහන් බන්දුප්‍රිය යැයි සිතන්න.

(ලකුණු 15 යි)

සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

**10 ශ්‍රේණිය** | වර්ෂ අවසාන පරීක්ෂණය - 2018 | **21 S III**

## සිංහල භාෂාව හා සාහිත්‍යය III

**කාලය පැය දෙකයි**

**සැලකිය යුතුයි :**

* උපදෙස් දී ඇති පරිදි **ප්‍රශ්න පහකට පමණක්** උත්තර සපයන්න.
* **1,2,3,4 ප්‍රශ්නවලටත් 5,6,7 ප්‍රශ්නවලින් එකකටත්** උත්තර සපයන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත **ලකුණු ගණන 80** කි.

01. **1 සිට x තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නො ලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අදින්න.**

i. (අ) පන්සිය පනස් ජාතක පොත නිර්මාණය කිරීම සඳහා පාදක කොට ගත් ප්‍රධාන මූලාශ්‍රය කුමක් ද?
(ආ) උම්මග්ග ජාතකය රචනා කිරීමේ මූලික අරමුණ වූයේ කුමක් ද?

ii. (අ) ගුත්තිල කාව්‍යය රචනා කිරීම සඳහා ආරාධනය කරනු ලැබුවේ කවුරුන් විසින් ද?
(ආ) ගුත්තිල කාව්‍ය නිර්මාණය කළේ කිනම් ජාතක කථාව ඇසුරු කර ගෙන ද?

iii. (අ) විවේකය දැනුවත්කමින් හා විනෝදයෙන් ගත කිරීම සඳහා යොදා ගත් ජන කවි විශේෂය කුමක් ද?
(ආ) සිංහල ජන කවිය අනුරාධපුර යුගය දක්වා දිවෙන ඉතිහාසයක් ඇති බවට ඇති සාක්ෂිය කුමක් ද?

iv. (අ) අතීත සිංහලයින්ගේ ජන ජීවිතය අළලා විදේශිකයන් ලියූ නවකතා අතර විශිෂ්ටතම නවකතාව ලෙස සැලකෙන්නේ කුමන නවකතාව ද?
(ආ) එය රචනා කළ තැනැත්තාගේ සම්පූර්ණ නම කුමක් ද?

v. පහත සඳහන් කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

ජාතික රණ දෙරණ මතේ
..............................................
..............................................
නැළවෙන බව සිතනු පුතේ

(අ) ................................
(ආ) ................................

vi. (අ) එච්.එම්.කුඩලිගම කවියා විසින් රචිත වඩාත් ජනප්‍රිය වූ කාව්‍ය සංග්‍රහය කුමක් ද?
(ආ) ඔහු ආභාෂය ලැබූ පෙරදිග මහා කවියා කවුරුන් ද?

vii. (අ) සිංහබාහු නාටකය රචනා කොට ඇත්තේ කිනම් නාට්‍ය ශෛලියට අනුව ද?
(ආ) වල්මත් වී හසරක් නුදුටිමි, ලොකු පුතා නොහොත් බන්දුලගේ පරාවර්තනය යන නවකතා රචනා කළ ලේඛකයා නම් කරන්න.

viii. (අ) එස්. මහින්ද හිමියන් කුඩා කළ හැඳින්වූ ගිහි නාමය කුමක් ද?
(ආ) උන් වහන්සේ විසින් රචිත මුල් ම කාව්‍ය කෘතිය කුමක් ද?

ix. (අ) වෑත්තෑවේ හිමියන්ගේ ගුරු හිමියන් නම් කරන්න.
(ආ) ගුත්තිල කාව්‍යයේ ඇතුළත් පද්‍ය සංඛ්‍යාව කොපමණ ද?

x. (අ) ජාතක කතා මූලාශ්‍ර කොට ගෙන රචිත ගී කාව්‍ය දෙකක් නම් කරන්න.
(ආ) ජාතක කතා මූලාශ්‍ර කොට ගෙන කෝට්ටේ යුගයේ දී රචිත කවි බණ සාහිත්‍යය කෘති දෙකක් නම් කරන්න.

(2x10-20)

**02.පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.**

i. ''ආ,එහෙනම් අපිට බෑ මෙහිදී මොකුත් කියන්ඩ උඹ කඹුරුපිටියට ගිහින් ඒජන්ත හාමුදුරුවන්ට පෙත්සමක් දීපන්''

(අ) මෙම ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් කා හට ද?
(ආ)මේ පාඨය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් දක්වන්න.

ii.''බැලුව මැනව, දේවයන් වහන්ස, මෙබඳු ඇඹුල මලක් හා මේ සා දිග ඇඹුල දණ්ඩක් දුටු විරූ දෑ නැත''

(අ) මෙම ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් කා හට ද?
(ආ)එය ශ්‍රවණය කළ තැනැත්තා ඉන් පසුව කීවේ කුමක් ද?

iii.තත මතු ද සින්දේ
<u>පිළිමල්</u> දප ද සින්දේ
යස දිගත ඇන්දේ
<u>විජය සිරි සඳ</u> ගෙන වැලන්දේ

(අ) අංකිත පදවල අර්ථ ලියන්න.
(ආ)මෙහි සඳහන් පරිදි වීණා තතට අමතර ව සුන් කරනු ලැබුවේ කුමක් ද?

iv.ඇස නැති දා පොත ගත්තේ කියන්ට ද
දත නැති දා උක් දඬු ගිනි තපින්ට ද
වෙර නැති දා ගහ ගත්තේ දිනන්ට ද
යුද ඇති දා නැති කග කොස් කොටන්න ද

(අ) මෙම පද්‍යයෙන් කියවෙන පණිවිඩය එක් වාක්‍යයකින් දක්වන්න.
(ආ)ඒ සඳහා ජන කවියා උපහැරණ කීයක් භාවිත කොට තිබේ ද?

v. "ප්‍රේමවන්ත දරුවනි මා
හිඳිනු කන් යොමා
කියමි පුවත සැක දුරැරා
අසන තිතියෙනා"

(අ) මෙහිදී සැක දුරු කොට පැවසූ අභිරහස කුමක් ද?
(ආ)ඒ රහස හෙළි කිරීමට සුප්පා දේවිය කටයුතු කළේ ඇයි?

(ලකුණු 4x5 = 20)

03.i. රාජපාක්ෂිකභාවය
ii.යුද්ධෝපාය යෙදීම යන කරුණු අතින් මහෞෂධ පඬිතුමා මෙන් ම කේවට්ට බමුණා යන දෙදෙනා ම එක හා සමාන ය. නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට **උදාහරණ අවස්ථා දෙක බැගින්** දක්වමින් විමසන්න.

**නැතහොත්**

i. සරල බස් වහරක් යොදා ගැනීමත්
ii.වටිනා ජීවිත අරුත් සැපයීමත් නිසා ගංගාවේ සංගීතය පද්‍ය පන්තිය රසවත් වී ඇති අයුරු එක් කරුණකට **උදාහරණ පද්‍ය දෙක බැගින්** දක්වමින් විමසන්න.

(ලකුණු 15 යි)

04.i. ඒ ඒ අවස්ථාවන්ට උචිත පරිදි විරිත් භාවිත කිරීම
ii.උචිත උපමා හා රූපක භාවිතය ගුත්තිල කතුවරයාගේ ප්‍රතිභාපූර්ණ කවිත්වය මනාව ප්‍රකට කරන අයුරු නියමිත කොටසින් **උදාහරණ දෙක බැගින්** දක්වමින් විමසන්න.

**නැතහොත්**

i. යෞවනයකුගේ හැඩි දැඩි ගති ස්වභාවය
ii.යෞවනියකගේ මුදු මොලොක් ගති ස්වභාවය සිංහබාහු හා සිංහසීවලිගේ චරිතයෙන් නිරූපණය වන අයුරු නියමිත කොටසින් **උදාහරණ දෙක බැගින්** දක්වමින් විමසන්න.

(ලකුණු 15 යි)

05.පැරණි සමාජයේ ජීවත්වූවන් තම වටපිටාවෙන් ලත් අත්දැකීම් ඇසුරින් ඊළඟ පරම්පරාවට වටිනා උපදෙස් දී ඇති අයුරු **'හානා හීය පානා අඬහැරෙත් දැනේ'** ජන කවි සමූහයෙන් ප්‍රකට වන අයුරු උදාහරණ කවි තුනක් ඇසුරින් පහදන්න. (ලකුණු 10 යි)

06.පුංචි මැණිකා තුළ පවත්නා තැන්පත් ගති ස්වභාවයන් නිසා ඇය පාඨක අනුකම්පාවට පාත්‍ර වන අයුරු නියමිත කොටසින් **සුදුසු උදාහරණ අවස්ථා තුනක් ඇසුරින්** විමසන්න. (ලකුණු 10 යි)

07.රට, දැය, සමය පිළිබඳ උසස් සිතුවිලි හා ආකල්ප වඩවන වීර කාව්‍යයක් ලෙස දරු නැලවිල්ල හෙවත් ජාතික තොටිල්ල පද්‍ය පන්තිය අගය කළ හැකි අයුරු නියමිත **කොටසින් උදාහරණ අවස්ථා තුනක්** දක්වමින් විමසන්න. (ලකුණු 10 යි)

## වර්ෂ අවසාන පරීක්ෂණය - 2018
## සිංහල භාෂාව හා සාහිත්‍යය - 10 ශ්‍රේණිය
## පිළිතුරු පත්‍රය
## I කොටස

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | 3 | 11. | 1 | 21. | 2 | 31. | 1 |
| 2. | 4 | 12. | 3 | 22. | 4 | 32. | 1 |
| 3. | 2 | 13. | 4 | 23. | 3 | 33. | 2 |
| 4. | 3 | 14. | 1 | 24. | 3 | 34. | 3 |
| 5. | 4 | 15. | 3 | 25. | 4 | 35. | 1 |
| 6. | 1 | 16. | 4 | 26. | 4 | 36. | 1 |
| 7. | 2 | 17. | 2 | 27. | 3 | 37. | 4 |
| 8. | 1 | 18. | 1 | 28. | 4 | 38. | 4 |
| 9. | 3 | 19. | 4 | 29. | 4 | 39. | 1 |
| 10. | 2 | 20. | 1 | 30. | 1 | 40. | 1 |

## II කොටස

01. (අ) සඤ්ඤක / අර්ධ අනුනාසික
(ආ)අර්ධ ස්වර / අන්තඃස්ථ / අන්තඃස්ථාක්ෂර

02. (අ) ස්වභාවය යන අරුත
(ආ)ස්වල්පයක් යන අරුත

03. (අ) සුවිශේෂ
(ආ)අතර

04. (අ) ප්‍රබන්ධය
(ආ)සතතාභ්‍යාසය

05. (අ) අනූන
(ආ)සුමධුර

06. (අ) පන්තියේ ළමයි සියල්ලෝම එකාවන්ව වැඩ කරති.
(ආ)සභාවෝ තුමූ සතුටු සිතින් විසිර ගියහ.(නිවැරදි වැකියකි)

07. (අ) පස් + සාලිස්
(ආ)නො + එක්

08. (අ) ගුරුවරු විසින් සිසුන්ට උපදෙස් දෙනු ලැබේ.
(ආ)සත්ත්වවේදියකු විසින් අසරණ සතෙක් රැක බලා ගනු ලැබේ/ ගැනේ

09. (අ) දැම්මා
(ආ)මොනවද?

10. (අ) ජලයෙන්
(ආ)ජාතියේ

(ලකුණු 2x10=20)

02. වාක්‍ය රචනය
ලකුණු විග්‍රහය ; මුළු ලකුණු 25 යි
1. සාරවත් භාවය, මාතෘකාවද ඇතුළුව ලකුණු 08 යි
2. සංවිධානය, නිර්මාණාත්මක භාවය හා ස්වීයත්වය ලකුණු 12 යි
3. ශිල්පීය දක්ෂතා හා ඡේද බෙදා ලිවීම ලකුණු 05 යි
(රචනයට නියමිත වචන ගණන ගැන සැලකිලිමත් විය යුතු ය.නියමිත සංඛ්‍යාවට අඩු හෝ වැඩි වන කල්හි අනුපාතිකව ලකුණු පිරිනැමිය යුතු ය.)

03. සාරාංශකරණය - මුළු ලකුණු ප්‍රමාණය 10යි.
ලකුණු විග්‍රහය
01. අන්තර්ගතය - ලකුණු 06 යි.
02. වචන ගණන - ලකුණු 02 යි.
03. ශිල්පීය දක්ෂතා - ලකුණු 02 යි.
(වචන ගණන 50ට අඩු හා 70 ට වැඩි වන කල්හි අනුපාතිකව ලකුණු පිරිනමන්න. සාරාංශයට පිරිනැමිය හැකි අවම ලකුණු ගණන 03කි)

අන්තර්ගත අදහස් ;
1. අතීත සමාජයෙහි මිනිසුන් අතර සම්බන්ධතා ගොඩනැගීමට ගොවිතැන ඉවහල් විය.
2. ඒවායේ සිදුවන සාමූහික ක්‍රියාකාරකම් නිසා පටු වාද භේද අමතක කොට එකමුතු ව ක්‍රියා කලහ.
3. එය සමාජයේ පැවැත්මට හා දියුණුවට හේතු විය.
4. නවීන සමාජයේ එවැනි සාමූහික කටයුතු යන්ත්‍ර මගින් සිදු කිරීම නිසා සමාජ සම්බන්ධතා බිඳ වැටී ඇත.
5. අජීවී යන්ත්‍ර සමඟ ගත කිරීම මානව ළැදියාව අඩු වීමට හේතු වී ඇත.

04.
1. නිදහස හා සමානාත්මතාව
2. එමගින් සමස්ත ප්‍රජාතන්ත්‍රවාදයේ පැවැත්ම තීරණය වීම.
3. සමගිය, සමානාත්මතාව හා දේශපාලන ස්ථාවරත්වය ගොඩ නැගීම.
4. සියලුම මිනිසුන් අභිමානය හා අයිතිවාසිකම් අතින් සමානව උපත ලබා ඇති බැවින් සියලු දෙනා සහෝදරත්වයෙන් ක්‍රියා කළ යුතු බව
5. ප්‍රජාතන්ත්‍රවාදය (2x5=10)

05. ප්‍රායෝගික ලේඛන (ලකුණු 15 කි)
ලකුණු විග්‍රහය
1. ආකෘතිය ලකුණු 05 කි.
2. අන්තර්ගතය ලකුණු 07 කි.
3. ශිල්පීය දක්ෂතා ලකුණු 03 කි.

III පත්‍රය

01.
I. අ. පාලි ජාතකට්ඨ කථාව
ආ.මහෞෂධ පණ්ඩිතුමාගේ බුද්ධි මහිමය ප්‍රකාශ කිරීම.
II. අ. සලාවත ජයපාල මැතිතුමන්
ආ.ගුත්තිල ජාතකය
III. අ. තේරවිලි කවි
ආ.සංයුක්ත නිකායට්ඨ කතාවේ පරමත්ත ජෝතිකාවේ සඳහන් පරිදි මග අසබඩ කෙතක් රකිමින් සිටි සිංහල කාන්තාවක ජාති, ජරා, මරණ පිළිබඳව සිංහල බසින් කී ගීයක් අසා සඟ සැට නමක් රහත් වීමේ සිදු වීම.
IV. අ. බැද්දේගම
ආ.ලෙනාඩ් සිඩ්නි වුල්ෆ්
V. අ. ගැටී වැටී මළ මොහොතේ
ආ. සුන්දර සුරඹුන්ගේ අතේ
VI. අ. ඈ
ආ. රවීන්ද්‍රනාත් තාගෝර්
VII.අ. ශෛලීගත හෙවත් නාට්‍ය ධර්මී ආ. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර
VIII.අ.ඇස්.කේ. තෂී නම්ග්‍යාල් ආ. ඔවා මුතු
IX. අ. තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් ආ. 511
X. අ. මුවදෙව්දාවත, සසදාවත, කව්සිළුමිණ ආ. කාව්‍යශේඛරය, ගුත්තිල කාව්‍ය
(ලකුණු 2x10-20 යි)

02.
I. අ. හිරපල්ලා විසින් පුංචි මැණිකාට
ආ.පුංචි මැණිකා බබුන් පිළිබඳ තොරතුරු සෙවීමට තංගල්ල බන්ධනාගාරයට ගිය අවස්ථාවේ එහි සිටි සිරපල්ලා ඇගේ ළඟ සල්ලි තියනවාදැ යි අසා, නැති බව දැන ගත් පසු තොරතුරු කීමට නොහැකි බව පැවසූ අවස්ථාව
II. අ. චර පුරුෂයකු විසින් චූලනී බ්‍රහ්මදත්ත රජුට
ආ.නෙළුම් දණ්ඩේ දිග මැන බලව
III. අ. විරුද්ධවාදියා/ප්‍රතිවාදියා
ආ.ප්‍රතිවාදියාගේ ආඩම්බරය
IV. අ. නිසි කළ නොකරන හැම දේම නිෂ්ඵල කාර්යයන් බව
ආ. හතරයි
V. අ. සුප්පා දේවිය වංග දේශයෙහි කුමාරිකාවක් බව
ආ. සිංහයා නිතරම දකින හෙයින් ද දරුවන් වයසින් මෙන් ම නුවණින් වැඩීම නිසා සත්‍ය දකින හෙයින් බොරු කීමෙන් තව දුරටත් ඵලක් නොවන බව තේරුම් ගිය නිසා (ලකුණු 4x5=20 යි)

3., 4., 5. } ලකුණු 15 බැගින්

6., 7. } ලකුණු 10 බැගින්